" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

103

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.04 21 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.04.08 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.03.28<br>රා.ප.චක්‍රලේඛ 05/2022 | 2022 රාමලාන් (රාමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබා දීම |
| 02 | 2022.04.07<br>රා.ප.චක්‍රලේඛ 07/2022 | රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින 02ක් ප්‍රකාශයට පත් කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන) ,
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

o/c 04/21

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.04.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින 02ක් ප්‍රකාශයට පත් කිරීම</u>**

අප්‍රේල් 08 වන දින සහ එළඹෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්දෙන් පසු කාර්යාල විවෘත වන අප්‍රේල් 18 වන දින දක්වා කාලය තුළ අප්‍රේල් 11 සහ 12 දින දෙක පමණක් රජයේ කාර්යාල විවෘතව තැබිය යුතුව ඇත.

02. ඉහත සඳහන් පරිදි අප්‍රේල් 11 සහ 12 දෙදින රජයේ කාර්යාල විවෘත කළ ද එම දිනයන්හි නිලධරයන්ගේ සහ සේවාලාභීන්ගේ පැමිණීමෙහි අඩුවීමක් අපේක්ෂා කළ හැකි බැවින් එම දින දෙක කාර්යාල විවෘත කර තැබීමට දැරිය යුතු වියදමට සාපේක්ෂව ලැබෙන ප්‍රතිඵලය අඩු විය හැක. එම තත්ත්වය සැළකිල්ලට ගෙන අප්‍රේල් 11 සහ 12 දෙදින රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින දෙකක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

03. රජයේ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය